සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

| ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 - 10 | |
| 11 - 24 | |
| 25 - 34 | |
| 35 - 40 | |
| එකතුව | |

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் /
Department of Examinations, Sri Lanka

# 2563 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2019 දෙසැම්බර්

NEW (නව නිර්දේශය) 10 S I, II

## (10) භූගෝල විද්‍යාව - I, II

පැ තුනයි

2019.12.26 /12.30 - 15.40

අමතර කියවීම් කාලය -මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

### භූගෝල විද්‍යාව - I පත්‍රය

විභාග අංකය :.........................

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය. *(ලකුණු 01 × 40 = 40 යි)*
* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

● අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නයේ හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා, **තිත් ඉර මත** ලියන්න.

1. ශ්‍රී ලංකාවේ උපරිම දිග 432 km කි. එම දුර ගණනය කර ඇත්තේ පේදුරු තුඩුවේ සිට .................................... දක්වා ය.
(ෆවුල් තුඩුව, දෙවුන්දර තුඩුව, සංගමන් කන්ද තුඩුව)

2. වායුවේ අඩංගුව ඇති ජලවාෂ්ප ප්‍රමාණය .................................... වශයෙන් හැඳින්වේ.
(ආර්ද්‍රතාව, වායුපීඩනය, උත්ස්වේදනය)

3. නොවැම්බර්, දෙසැම්බර්, ජනවාරි මාසවල උත්තරාර්ධ ගෝලීය රටවලට ............................ සෘතුව උදා වේ.
(ග්‍රීෂ්ම, වසන්ත, ශීත)

4. ශ්‍රී ලංකා මුහුදු වෙරළේ සිට නාවුක සැතපුම් 200 දක්වා වූ මුහුදු ප්‍රදේශය .................................... ලෙස නම් කර ඇත.
(රාෂ්ට්‍රීය මුහුද, යාබද මුහුද, අනන්‍ය ආර්ථික කලාපය)

5. භූමි කම්පාවක තීව්‍රතාව මනිනු ලබන්නේ .................................................. මගිනි.
(පීඩනමානය, රිච්ටර් පරිමාණය, බෝෆට් පරිමාණය)

6. ලෝකයේ ජෛව විවිධත්වය අධිකතම වෘක්ෂලතා කලාපය වනුයේ ............................ වනාන්තර කලාපයයි.
(සැවනා, නිවර්තන වර්ෂා, කේතුධර)

7. ව්‍යාපාරික කිරිපට්ටි පාලනය කෙරෙන ප්‍රධානතම ආසියාතික රට .................................... යි..
(ඉන්දියාව, පාකිස්තානය, චීනය)

8. ආසියාව හැරුණු විට ලෝකයේ වැඩිම ජන සංඛ්‍යාවක් ජීවත්වන මහාද්වීපය වන්නේ ............................ යි.
(යුරෝපය, උතුරු ඇමරිකාව, අප්‍රිකාව)

9. ..................... ලෝකයේ විවිධ කාර්මික නිෂ්පාදන සඳහා භාවිත වන ප්‍රධාන අමුද්‍රව්‍යය කි.
(තේ, රබර්, පොල්)

10. සංවර්ධනයේ දී ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ඉතා වැදගත් කරුණු ඉදිරිපත් කෙරෙන බුද්ධ දේශනාවක් ලෙස .................................... සූත්‍රය දැක්විය හැකි ය.
(වනරෝපන, සිගාලෝවාද, මහානාම)

[ 2 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

● අංක **11** සිට **15** තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති ප්‍රකාශය කියවා බලා, එය නිවැරදි නම් 'නි' යන්න වටා ද වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.

11. පෘථිවි අභ්‍යන්තරයේ ඇති මැග්මා ඉහළට පැමිණ ඝනවීමෙන් අවසාදිත පාෂාණ නිර්මාණය වේ. ( නි / වැ )

12. සම්පත් සංරක්ෂණය යනු වර්තමාන මිනිස් අවශ්‍යතා සපුරා ගනිමින් අනාගත පරම්පරාව සඳහා ඒවා සුරක්ෂිත කිරීමයි. ( නි / වැ )

13. කෑගල්ල දිස්ත්‍රික්කයේ පිහිටි බෝගල පතල මිනිරන් සඳහා ප්‍රසිද්ධ ය. ( නි / වැ )

14. ශ්‍රී ලංකාවේ වියලි කලාපීය ප්‍රදේශවල රතු දුඹුරු ලැටසෝල් පස ව්‍යාප්තව තිබේ. ( නි / වැ )

15. ගොඩබිම මෙන් ම සාගර පතුලේ ද භූමිකම්පා සිදුවිය හැකි ය. ( නි / වැ )

● අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයේ හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

16. බටහිර පැසිපික් සාගරයේ හටගන්නා වාසුළි ...................... නමින් හැඳින්වේ.

17. ජීවීන්ගේ පැවැත්ම සඳහා අවශ්‍යවන ප්‍රධාන ස්ථායි වායු වර්ග වන්නේ ඔක්සිජන් හා ............................ ය.

18. මිනිසාට බහුලව ආපදා සිදු කරන එමෙන්ම වලාකුළු හා පොළොව අතර විසර්ජනය වන අකුණු සැර ........................ අකුණු ලෙස හැඳින්වේ.

19. රූපවාහිනිය හා අන්තර්ජාලය ශ්‍රව්‍ය දෘෂ්‍ය ...................... මාධ්‍ය ලෙස හැඳින්විය හැකි ය.

20. තංගල්ල, රන්න හා ...................... අතර ප්‍රදේශය සුළුපොල් ත්‍රිකෝණය ලෙස නම් කෙරේ.

● අංක **21** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයේ නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියෙන් ඇති වරහන තුළ ලියන්න.

21. ආසියාවෙන් පිටත වී වගා කෙරෙන ප්‍රදේශ අතුරින් ඒ සඳහා බහුලව යන්ත්‍ර සූත්‍ර භාවිත කෙරෙන ප්‍රදේශයක් වන්නේ
   (1) මැඩගස්කරය යි.
   (2) බ්‍රසීලයේ නැගෙනහිර වෙරළ ප්‍රදේශයයි.
   (3) ඕස්ට්‍රේලියාවේ මරේ ඩාලිං ගං නිම්න ප්‍රදේශය යි.
   (4) ඉතාලියේ පෝ ගං නිම්න ප්‍රදේශය යි. (.........)

22. ලෝම හා ලැටරයිට් පස වඩාත් යෝග්‍ය වන්නේ මින් කුමන වගාවට ද?
   (1) තේ (2) රබර් (3) වී (4) කිරිඟු (.........)

23. නව තාක්ෂණික සොයා ගැනීම් සමග වේගයෙන් වර්ධනය වන කර්මාන්තයක් වන්නේ කුමක් ද?
   (1) ඇඟලුම් කර්මාන්තය (2) සංචාරක කර්මාන්තය
   (3) වාහන කර්මාන්තය (4) විද්‍යුත් කර්මාන්තය (.........)

24. කිසියම් ප්‍රදේශයක ජන සංඛ්‍යාව එම ප්‍රදේශයේ වර්ග ප්‍රමාණයෙන් බෙදූ විට සොයාගත හැකි වනුයේ කුමක් ද?
   (1) ජනගහන වර්ධනය (2) ජන ඝනත්වය
   (3) ජන සංයුතිය (4) ජන ව්‍යාප්තිය (.........)

[ 3 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

25. වසර 2000 සිට ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධන අනුපාතිකය,

(1) වැඩිවෙමින් පවතී. (2) අඩු වෙමින් පවතී.

(3) සමාන මට්ටමක පවතී. (4) සෘණ අගයයක් ගනී. (.........)

26. පොහොර නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ඇපටයිට් ඛනිජය ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තව ඇත්තේ,

(1) පුල්මුඩේ ය. (2) බලංගොඩ ය.

(3) එප්පාවල ය. (4) මාතලේ ය. (.........)

27. මාර්තු සහ අප්‍රේල් මාසවලදී ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ක්‍රමය කුමක් ද?

(1) නිරිත දිග මෝසම් (2) ඊසාන දිග මෝසම්

(3) වාසුළි (4) සංවහන (.........)

28. ජාතික උද්‍යාන පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) මාදුරුඔය, උඩවලව (2) හග්ගල, රිටිගල

(3) සෝමාවතිය, ගිරිතලේ (4) සිංහරාජ, නකල්ස් (.........)

29. සමාන්තර හෙල්වැටි අතුරින් ගලා බස්නා කලු ගඟේ ඉහළ කොටස්වල දක්නට ඇති ජලවහන රටාව කුමක් ද?

(1) අරීය (2) ශාඛීය (3) වලයාකාර (4) ජාලාකාර (.........)

30. වර්තමානයේ විශාල වශයෙන් ගුවන්යානා නිෂ්පාදනය කරනු ලබන්නේ,

(1) භාණ්ඩ ප්‍රවාහනය සඳහා ය. (2) මගී ප්‍රවාහනය සඳහා ය.

(3) යුද කටයුතු සඳහා ය. (4) ගවේෂණ කටයුතු සඳහා ය. (.........)

31. අනාවැකි පළ කිරීම්, අනතුරු ඇඟවීමේ නිවේදන නිකුත් කිරීම් වැනි කාර්යයන් ආපදා කළමනාකරණ චක්‍රයේ කුමන අවස්ථාවකට අනුබද්ධ ඒවා ද?

(1) පෙර සූදානම (2) ප්‍රතිචාර දැක්වීම

(3) යථා තත්ත්වයට පත් කිරීම (4) අවම කිරීම (.........)

32. පෘථිවියේ ඕනෑම ස්ථානයක හෝ රූපමිතියක පිහිටීම ඉතාමත් නිවැරදිව හඳුනාගැනීම සඳහා නිර්මාණය කර ඇති යාන්ත්‍රණ පද්ධතිය හඳුන්වන නම කුමක් ද?

(1) භූගෝලීය තොරතුරු පද්ධතිය (2) අවකාශීය දත්ත පද්ධතිය

(3) ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය (4) ගුවන් ඡායාරූප සැලසුම් පද්ධතිය (.........)

- අංක **33** සහ **34** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත රූපසටහන යොදාගන්න.




33. මෙහි වැඩිම වර්ෂාපතනයක් ලැබෙන ප්‍රදේශය වන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය. (.........)

34. සුළං මුවාව යනුවෙන් හැඳින්වෙන ප්‍රදේශය වන්නේ,

(1) A හා B ය. (2) B හා C ය. (3) C හා D ය. (4) A හා D ය. (.........)



Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

● අංක **35** සිට **38** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත ප්‍රස්තාරය උපයෝගී කරගන්න.

2001 සහ 2002 ප්‍රධාන වෙළෙඳපොළවල් දහය අනුව ශ්‍රී ලංකාවට සංචාරකයින්ගේ පැමිණීම




මූලාශ්‍රය : Sri Lanka Tourist Board

35. 2002 වසරේදී ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 2001 වසරට වඩා වැඩි වී ඇති රටවල් අතුරින් විශාලම වැඩිවීම දක්වන රට,

(1) ඉන්දියාවයි. (2) ජපානයයි.
(3) ඇමරිකා එක්සත් ජනපදයයි (4) මාලදිවයිනයි. (.........)

36. 2001 සහ 2002 යන වසර දෙකේ දී ම ශ්‍රී ලංකාවට වැඩියෙන් ම සංචාරකයින් පැමිණි රට වනුයේ,

(1) ඉන්දියාවයි. (2) ජර්මනියයි. (3) බ්‍රිතාන්‍යයයි. (4) ප්‍රංශයයි. (.........)

37. පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) එක් එක් වසරේ පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව 30,000 ඉක්මවා ඇත්තේ එක් රටක් පමණි.
(2) වසර දෙකේදී ම මාලදිවයිනෙන් පැමිණි සංඛ්‍යාව ඕස්ට්‍රේලියාවෙන් පැමිණි සංඛ්‍යාවට වඩා අධිකය.
(3) සංචාරකයින් පැමිණි ප්‍රමුඛ රටවල් දහය අතුරින් වැඩි සංඛ්‍යාවක් පැමිණ ඇත්තේ යුරෝපා මහාද්වීපයෙනි.
(4) වසර දෙකෙහිදී ම ප්‍රංශය හා ඕස්ට්‍රේලියාවෙන් සමාන සංචාරකයන් සංඛ්‍යාවක් පැමිණ ඇත. (.........)

38. මෙම ප්‍රස්තාර වර්ගය හැඳින්වෙන නම කුමක් ද?

(1) රේඛීය ප්‍රස්තාර (2) සිරස් තීරු ප්‍රස්තාර
(3) තිරස් තීරු ප්‍රස්තාර (4) වෘත්ත ප්‍රස්තාර (Pie chart) (.........)

● අංක **39** සහ **40** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සාධක යුගල පහ උපයෝගී කර ගන්න.

*A.* (i) සංවර්ධන කටයුතු
(ii) දරිද්‍රතාව

*B.* (i) අධ්‍යාපන පහසුකම්
(ii) වියපත් ජන සංඛ්‍යාව

*C.* (i) ගෝලීය උෂ්ණත්වය
(ii) සාගර ජල මට්ටම

*D.* (i) ජල දූෂණය
(ii) පිරිසිදු ජලය

*E.* (i) සෞඛ්‍ය පහසුකම්
(ii) ආයු කාලය

39. පළමුවැන්නේ වැඩිවීම දෙවැන්නේ ද වැඩිවීමට හේතුවන සාධක යුගල දෙක දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) *A* සහ *B* (2) *B* සහ *C* (3) *C* සහ *D* (4) *C* සහ *E* (.........)

40. පළමුවැන්නේ වැඩිවීම දෙවැන්නේ අඩුවීමට හේතුවන සාධක යුගල දෙක දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) *A* සහ *B* (2) *A* සහ *D* (3) *B* සහ *C* (4) *B* සහ *E* (.........)

*(ලකුණු 01 × 40 = 40 යි)*

* *



Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

910

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2563 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2019 දෙසැම්බර්**

**NEW**

(නව නිර්දේශය)

**10 | S | I, II**

**(10) භූගෝල විද්‍යාව - I, II**

**භූගෝල විද්‍යාව - II පත්‍රය**

- ✳ මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් සමන්විත ය.
- ✳ I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද II කොටසින් ප්‍රශ්න හතරකට ද පිළිතුරු සපයන්න.
- ✳ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.
- ✳ පිළිතුරු සැපයියමට ලබා දී ඇති ඇමුණුම් අංක 2 සහ 3 ඔබේ පිළිතුරු පත්‍රයට අමුණන්න.

## I කොටස

**1.** (අ) ඔබ වෙත සපයා ඇති 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස (ඇමුණුම අංක 01) අධ්‍යයනය කොට, ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලබාදීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (ඇමුණුම අංක 02) යොදා ගන්න.

අංක (i) සිට (vi) දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරන්න.

(i) Ⓐ අක්ෂරයෙන් දක්වා ඇති කඳු මුදුනේ උස කොපමණ ද?
(380m අඩු / 380m - 400m අතර / 400m වැඩි) *(ලකුණු 01 යි)*

(ii) Ⓑ අක්ෂරයෙන් දැක්වෙන ස්ථානයේ අක්ෂාංශීය අගය වනුයේ
(6° 45′ ය / 81° 05′ ය / 235 ය) *(ලකුණු 01 යි)*

(iii) Ⓒ – Ⓓ රේඛාවෙන් දැක්වෙන භූලක්ෂණය කුමක් ද?
(මඳ බෑවුම / දළ බෑවුම / උත්තල බෑවුම) *(ලකුණු 01 යි)*

(iv) Ⓔ අක්ෂරයෙන් දැක්වෙන පරිපාලන මායිම කුමක් ද?
(පළාත් මායිම / දිස්ත්‍රික් මායිම / ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාස මායිම) *(ලකුණු 01 යි)*

(v) Ⓕ අක්ෂරයෙන් දැක්වෙන ප්‍රදේශයේ භූමි පරිභෝග වර්ගය කුමක් ද?
(වනාන්තර / හේන් වගාව / ගෙවතු වගාව) *(ලකුණු 01 යි)*

(vi) ප්‍රධාන මංසන්ධියේ සිට නැගෙනහිර මායිම දක්වා වැටී ඇති A4 මහාමාර්ග කොටසේ දුර කොපමණ ද?
(4 km / 6 km / 7.5 km) *(ලකුණු 01 යි)*

(vii) සිතියම් ප්‍රදේශයේ ඇති ප්‍රධාන ගංගාව ගලන දිශාව කුමක් ද? *(ලකුණු 01 යි)*

(viii) Ⓟ අක්ෂරයෙන් දැක්වෙන චතුරස්‍රය තුළ සංකේත මගින් දක්වා ඇති රජයේ සේවා ලබාදෙන ආයතන දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ix) සිතියම් ප්‍රදේශයේ මධ්‍ය කොටසෙහි ජනාවාස ව්‍යාප්ත වීමට බලපා ඇති එක් හේතුවක් සඳහන් කරන්න. *(ලකුණු 01 යි)*

(ආ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියම (ඇමුණුම අංක 03) අධ්‍යයනය කොට, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරින් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, ඇමුණුම අංක 03 කඩදාසියෙහි අදාළ ස්ථානයේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ලියා දක්වන්න.

| | | |
|---|---|---|
| (i) | යාල ජාතික වනෝද්‍යානය | *(A, B, C)* |
| (ii) | ඩෙල්ෆ්ට් දූපත | *(D, E, F)* |
| (iii) | ආරුගම්බොක්ක සංචාරක ප්‍රදේශය | *(G, H, J)* |
| (iv) | ගිං ගඟ | *(K, L, M)* |
| (v) | තලවාකැලේ තේ පර්යේෂණ ආයතනය | *(P, Q, R)* |

[ 6 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

(ඉ) ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියම අධ්‍යයනය කොට, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (ඇමුණුම **3** බලන්න).

- අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරින් නිවැරදි පිළිතුර හිමි **අක්ෂරය සිතියමෙන් තෝරා, ඇමුණුම 03** කඩදාසියෙහි අදාළ ස්ථානයේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ලියා දක්වන්න.

(i) රොකී කඳුවැටිය (*A, B, C*)

(ii) නයිල් ගංගාව (*D, E, F*)

(iii) බීජිං (*G, H, J*)

(iv) උතුරු මුහුද (*K, L, M*)

(v) සුමාත්‍රා දූපත (*P, Q, R*)

## II කොටස

**2.** (අ) කාලගුණය යනු කුමක් ද? *(ලකුණු 02 යි)*

(ආ) ලෝකයේ ප්‍රධාන දේශගුණික කලාප තුන නම් කර, පහත සඳහන් රටවල් අතුරින් එම කලාපවලට අයත් රටවල් තෝරා එම කලාප ඉදිරියෙන් ලියා දක්වන්න.

ශ්‍රී ලංකාව, ග්‍රීන්ලන්තය, ජර්මනිය *(ලකුණු 03 යි)*

(ඉ) ශ්‍රී ලංකාවේ දේශගුණික විවිධත්වය ආහාරබෝග නිෂ්පාදනය කෙරෙහි බලපා ඇති ආකාරය නිදසුන් තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

**3.** (අ) ලෝකයේ ජල සම්පත් ව්‍යාප්තව ඇති ආකාර දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) ජලය දූෂණය වීමට බලපාන මානුෂ ක්‍රියාකාරකම් තුනක් දක්වන්න. *(ලකුණු 03 යි)*

(ඉ) ශ්‍රී ලංකාවේ ජල සම්පත සංරක්ෂණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග තුනක් යෝජනා කර ඉන් එකක් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

**4.** (අ) (i) පාරිභෝගික කෘෂිකර්මාන්තයට අයත්වන වගාවක් නම් කරන්න.

(ii) ව්‍යාපාරික කෘෂිකර්මාන්තයට අයත්වන වගාවක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) ලෝකයේ ව්‍යාපාරික කිරිපට්ටි පාලනයෙහි දක්නට ඇති විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(ඉ) ශ්‍රී ලංකාවේ තේ වගාව දියුණු කිරීම සඳහා මෑත කාලයේ ගෙන ඇති පියවර තුනක් දක්වා, ඉන් එකක් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

**5.** (අ) කර්මාන්ත ස්ථානගතවීමට බලපාන සාධක දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) පහත දැක්වෙන ශ්‍රී ලංකාවේ කර්මාන්ත සඳහා උදාහරණ දෙක බැගින් දක්වන්න.

(i) කෘෂිපාදක කර්මාන්ත

(ii) ඛනිජපාදක කර්මාන්ත

(iii) සේවා කර්මාන්ත *(ලකුණු 03 යි)*

(ඉ) සංචාරක කර්මාන්තය නිසා අප රටට ලැබෙන වාසි තුනක් සඳහන් කර, ඒවායින් එකක් තෝරා එය රටේ සංවර්ධනයට බලපාන ආකාරය පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

[ 7 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**6.** (අ) ආපදාව යනු කුමක්දැයි හඳුන්වන්න. *(ලකුණු 02 යි)*

(ආ) යාබද ශ්‍රී ලංකා සිතියමේ ආපදාවලට ප්‍රබල ලෙස ගොදුරුවන දිස්ත්‍රික්ක යුගල තුනක් *A, B, C* වශයෙන් දක්වා ඇත.

ඒවායින්,

(i) නායයෑම්

(ii) ජලගැලීම්

(iii) නියඟ

යන ආපදා බහුලව සිදුවන දිස්ත්‍රික්ක යුගල තෝරා ඒවාට අදාළ අක්ෂර ආපදාව සමගින් ලියා දක්වන්න. *(ලකුණු 03 යි)*

(ඇ) "ජලගැලීම්වලින් සිදුවන ආපදා තීව්‍ර වීම සඳහා ස්වාභාවික හේතූන්ට වඩා මානුෂ ක්‍රියාකාරකම් බලපා ඇත." නිදසුන් තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*




**7.** (අ) යාබද දක්වා ඇති ආසියා සිතියමෙහි සේයා කර තිබෙන

ⓐ ජනාධික කලාපය

ⓑ ජනහීන කලාපය හඳුනාගෙන

නම් කරන්න. *(ලකුණු 02 යි)*




(ආ) ⓐ කලාපය ජනාධික වීමට හේතු දෙකක් ද

ⓑ කලාපය ජනහීන වීමට එක් හේතුවක් ද

සඳහන් කරන්න. *(ලකුණු 03 යි)*

(ඇ) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව ආශ්‍රිත මෑත කාලීන ප්‍රවනතා තුනක් සඳහන් කර, ඉන් එකක් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

[ 8 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

**8.** (අ) යුගයෙන් යුගයට මිනිසා පරිසරය ප්‍රයෝජනයට ගත් ආකාරය දැක්වෙන අවස්ථා තුනකි. ඉන් දෙකක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(ආ) පහත දක්වා ඇති ගෝලීය පරිසර සම්මුතිවල ප්‍රධාන අරමුණ බැගින් සඳහන් කරන්න.

(i) රියෝ සම්මුතිය

(ii) රැම්සා සම්මුතිය

(iii) මොන්ට්‍රියල් සම්මුතිය *(ලකුණු 03 යි)*

(ඉ) ජීවීන්ට හා ස්වභාවධර්මයට ගරු කිරීම පිළිබඳව බුදුදහමේ දැක්වෙන ඉගැන්වීම් නිදසුන් තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. *(ලකුණු 05 යි)*

* * *

Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka

[ 9 වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2563 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2019 දෙසැම්බර්**

**(නව නිර්දේශය)**

**(10) භූගෝල විද්‍යාව - II පත්‍රය**

II පත්‍රයේ I කොටසේ 1. (අ), (ආ) සහ (ඉ) ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා මෙම කඩදාසිය යොදා ගන්න. මෙය ඔබේ පිළිතුරු පත්‍රයට අමුණන්න.

විභාග අංකය : ..............................

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා පමණි.

1. (අ) (i) ..............................

(ii) ..............................

(iii) ..............................

(iv) ..............................

(v) ..............................

(vi) ..............................

(vii) ..............................

(viii) ..............................

..............................

(ix) ..............................

මුළු ලකුණු



Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka

1. (ආ)




(i)
(ii)
(iii)
(iv)
(v)
5

1. (ඉ)




(i)
(ii)
(iii)
(iv)
(v)
5

1. (අ) 10 + (ආ) 5 + (ඉ) 5 = 20

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

(ඇමුණුම 01)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம / Department of Examinations, Sri Lanka

**2563 - මූලික පිරිවෙන් අවසාන විභාගය - 2019 දෙසැම්බර් (නව නිර්දේශය)**

# 2563 - Mulika Piriven Final Examination - 2019 December (New Syllabus)

(10) භූගෝල විද්‍යාව - II පත්‍රය / Geography - Paper II 910

1. (අ) භූ ලක්ෂණ සිතියම් කොටස / Topographic Map Section




SCALE 1:50,000

Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka